www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: සාකච්ඡා පිලිබඳ කතාවලට පිටුපසින් පූර්න පරිමාන යුද්ධයක තර්ජනය ලඹ දෙයි

**Sri Lanka: Behind talk of peace, threat of full-scale war looms**

**කේ. රත්නායක විසිනි**
**2006 මැයි 6**

ශ්‍රී ලංකා ආන්ඩුව සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර සාම සාකච්ඡා යලි අරඹන ලෙස එල්ල කෙරෙන ජාත්‍යන්තර පීඩනය තිබිය දී ම, දිවයිනේ උතුරේ හා නැගෙනහිර යුද කලාප තුල ප්‍රචන්ඩ ක්‍රියා අඛන්ඩව වැඩෙමින් පවතී.

මාස ගනනාවක් තිස්සේ දෙපාර්ශ්වය ම වග නොකියන ප්‍රහාර හා ප්‍රතිප්‍රහාර එල්ල කර ගැනීමෙන් පසුව පසු ගිය සතියේ එදිරිවාදිකම් විවෘත යුද ගැටුමක් බවට පිපුරුනි. අප්‍රේල් 25 දා, මරාගෙන මැරෙන බෝම්බකාරියක් කොලඹ දැඩි මුරකාවල් සහිත යුද හමුදා මූලස්ථානයට හොඳින් සැලසුම් කල ප්‍රහාරයක් එල්ල කොට අට දෙනෙකු ඝාතනය කලා ය. එය සිය වගකීම ප්‍රතික්ෂේප කලත්, යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා ඉලක්ක කර ගත් මෙම බෝම්බ ප්‍රහාරය එල්ටීටීඊය සැලසුම් කල බව මුලුමනින් ම පාහේ නිශ්චිත ය.

ශ්‍රී ලංකා මිලිටරිය නැගෙනහිර ත්‍රිකුනාමල නගරය අසල එල්ටීටීඊ පාලනය යටතේ පවත්නා සාම්පූර් ප්‍රදේශයේ ඉලක්කවලට ගුවන් ප්‍රහාර එල්ල කරමින් වහා ම එකට එක කලේ ය. අඩු ගනනේ 11 දෙනෙකු වත් මරා දැමුනු අතර තවත් බොහෝ සංඛ්‍යාවකට තුවාල සිදු විය. තවත් ප්‍රහාර එල්ල වෙතැයි බියෙන් සිය ගනන් ජනයා ප්‍රදේශයෙන් පලා ගියහ. මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය සහ පලිගැනීමේ ප්‍රහාරය යන දෙක ම 2002 දී අත්සන් කෙරුනු අස්ථාවර සටන් විරාම ගිවිසුම පැහැදිලිව ම උල්ලංඝනය කිරීමකි.

මහ බලවතුන් සහ ජාත්‍යන්තර මාධ්‍ය ගැටුම් යලි ඇවිලීම සම්බන්ධයෙන් එල්ටීටීඊයට දොස් පවරන නමුදු ඒ සඳහා මූලිකව වගකීම පැවරෙන්නේ සිංහල අන්තවාදී පක්ෂවල පිටුබලය ලබන, හොඳින් ගනන් බලා කෙරුනු ප්‍රකෝපකරනයන් මාලාවක ම නිමග්නව ඇති, ශ්‍රී ලංකා ආන්ඩුව සහ මිලිටරිය මත ය. එල්ටීටීඊයට  ප්‍රහාර එල්ල කිරීමේ යෙදෙන විවිධ දෙමල පැරා-මිලිටරි කන්ඩායම් සමග තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැතැයි සන්නද්ධ හමුදා සිරිතක් ලෙස කියා සිටින නමුදු එම ප්‍රකාශවලට ජෙනරාල් ෆොන්සේකා ඝාතනය කිරීමේ උත්සාහයට තමන්ගේ කිසිදු සම්බන්ධතාවක් නැතැයි එල්ටීටීඊය කරන කියාපෑම්වලට වඩා වැඩි විශ්වාසනීයත්වයක් නැත.

අප්‍රේල් 28 දා ඔස්ලෝහි පැවැති රැස්වීමකින් පසුව, ඊනියා සාම ක්‍රියාදාමයේ සම-සභාපතිවරු -- එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ -- "සියලු ප්‍රචන්ඩ ක්‍රියා" හෙලා දැක ඒවා අවසන් කරන ලෙස ඉල්ලා සිටියහ. ගැටුම පාලනය කර ගත නොහැකි මට්ටමට වර්ධනය වීම ගැන ඉන්දියානු රාජ්‍ය තාන්ත්‍රිකයෝ ද සිය උත්සුකතාව ප්‍රකාශ කලහ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මිලිටරිය එල්ටීටීඊ මධ්‍යස්ථානවලට ගුවන් ප්‍රහාර එල්ල කිරීම නතර කර ඇතත්, ආරක්ෂක හමුදාවන් සඵල වසයෙන් යුද තත්වයක දිගට ම ක්‍රියාත්මක වන අතර උතුරේ හා නැගෙනහිර රහසිගත ප්‍රහාර සහ ප්‍රතිප්‍රහාර අඛන්ඩව සිදු වේ.

දෙමල ජනයා "ත්‍රස්තවාදී සැකකරුවන්" ලෙස හිතුමතේ අත් අඩංගුවට ගනිමින්, ඔවුන්ගෙන් ප්‍රශ්න කරමින් හා ඔවුන් රඳවා ගනිමින්, පොලීසිය හා සොල්දාදුවන් සෝදිසි මෙහෙයුම් මාලාවක නිමග්නව ඇත. පසු ගිය සතියේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව, කොලඹ දෙමල ජනයා වැඩි වසයෙන් පදිංචි ප්‍රදේශවල සිදු කෙරුනු පොලිස් කඩා පැනීම්වල දී සිය ගනනක් රඳවා ගැනුනි. අඟහරුවාදා පුත්තලම් දිස්ත්‍රික්කයේ කම්හල්, ගඩොල් පෝරනු සහ සත්ව ගොවිපලවල සිදු කෙරුනු කඩා පැනීම්වලින් 83 දෙනෙකු රඳවා ගෙන ඇතැයි පොලීසිය නිවේදනය කලේ ය.

බ්‍රහස්පතින්දා, නාවික භටයකු හා සිවිල් වැසියන් සිවු දෙනකු ඝාතනය කරමින් නාවික හමුදා මුර සංචාරක කන්ඩායමකට බිම් බෝම්බ ප්‍රහාරයක් එල්ල වීමෙන් පසුව, හමුදාව හා පොලිසිය ත්‍රිකුනාමලයේ දෙමල ජනයා විශාල වසයෙන් වාසය කරන ප්‍රදේශවල සෝදිසි මෙහෙයුම් සිදු කලහ. එල්ටීටීඊයට හිතැති ටැමිල්නෙට් වෙබ් අඩවියට අනුව, කල්ලඩි, තිර්චෙන්තුර් හා ඩච්බාර් ඇතුලු මඩකලපුව අසල ගම්මානවල ද සෝදිසි මෙහෙයුම් දියත් කෙරී ඇත.

මිලිටරියේ ක්‍රියාකාරකම් කෙතරම් නම් ප්‍රකට ද කිය තොත් ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) පසු ගිය සතියේ නිකුත් කල ප්‍රකාශයක මෙසේ අදහස් දක්වී යඃ " ආන්ඩුවේ ආරක්ෂක හමුදාවන්, උතුරේ හා නැගෙනහිර, නීතියට පරිබාහිරව සිවිල් වැසියන් ඝාතනය කිරීමේ යෙදී ඇත යන්න ගැන ද අපි භීතියට පත්ව සිටිමු. මෙම දෝෂනය පදනම් වන්නේ අප බිම් මට්ටමේ සිදු කල නිරීක්ෂන හා විමසීම් මත ය." එස්එල්එම්එම් ප්‍රකාශිකා හෙලන් ඔල්ෆ්ස්ඩොට්ර්, ආන්ඩුව හා මාධ්‍ය මගින් එල්ල කෙරුනු රුදුරු විවේචනයන්ට ප්‍රතිචාර දක්වමින්, ආන්ඩුව හා මිලිටරි අන දෙන නිලධාරින් එම ඝාතන ගැන නොදන්නවා විය හැකි යැයි පිලිගත් අතර ඒ කෙසේ වෙතත්, ඇය කියා සිටියේ මිලිටරියේ " නොහික්මුනු කොටස්" හෝ " තනි පුද්ගලයන්" ඒවාට සම්බන්ධිත බව යි.

ලේවැකි ප්‍රකෝපකරනයන් දිගට ම පැවතී තිබේ. අඟහරුවාදා සන්නද්ධ කල්ලියක්, යාපනයේ පලවන එල්ටීටීඊ හිතැති දෙමල දිනපතා පුවත්පතක් වන උදයන් පත්‍රයේ මුද්‍රනාලයට හා කර්තෘ මන්ඩල කාර්යාලයට කඩා වැදී, එහි කලමනාකරු සහ තවත් සේවකයකු මරා දැමී ය. තවත් දෙදෙනෙකුට බරපතල තුවාල සිදු කෙරුනි. ආන්ඩුවේ ඇමතිවරු විකාර සහගත ලෙස එල්ටීටීඊයට චෝදනා කල නමුත්, ආන්ඩුවට හා මිලිටරියට සම්බන්ධිත සන්නද්ධ කන්ඩායමක් ප්‍රහාරයට වගකිව යුතු බවට, පුවත් පතේ කාර්ය මන්ඩලයට කිසිදු සැකයක් නැත.

බ්‍රහස්පතින්දා, මිලිටරිය නිවේදනය කල පරිදි, සොල්දාදුවන් නෙල්ලිඅඩිහි පිහිටි සිය කඳවුරට ප්‍රහාර එල්ල කිරීමට සූදානම් වූ, ත්‍රී-රෝද රථ දෙකකින් පැමිනි තරුනයන් හත් දෙනෙකු මරා දමා ඇත. කෙසේ වෙතත්, එල්ටීටීඊ හිතැති දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ), මිය ගිය තරුනයන්ගේ විස්තර සඳහන් කරමින්, ඔවුන් මුලුමනින් ම අහිංසක අය බව පෙන්වා දෙමින්, කොලඹ විදේශ තානාපති කාර්යාලය වෙත ලිපියක් යැවී ය.

ඔවුන්ගේ පාර්ශ්වයෙන්, එල්ටීටීඊය ද යුද්ධය සඳහා සූදානම් වේ. පසු ගිය සති අන්තයේ දී, එල්ටීටීඊයේ හමුදා වැලිකන්ද ප්‍රදේශයේ පිහිටි, කරුනා හෙවත් වී. මුරලිදරන්ගේ නායකත්වයෙන් යුත් එල්ටීටීඊයේ කැඩී ගිය කන්ඩායමට අයත් කඳවුරු තුනකට මූලික ප්‍රහාරයක් එල්ල කොට 15 දෙනෙකු මරා දැමී ය. කපිතාන්වරයකු ද ඇතුලු ශ්‍රී ලංකා හමුදාවේ සොල්දාදුවන් පස් දෙනෙක් ද එම ගැටුමේ දී මරා දැමුනු බවට එල්ටීටීඊය කියා පෑ නමුදු මිලිටරිය විසින් එය ප්‍රතික්ෂේප කරන ලදි.

2002 සටන් විරාමයේ කොන්දේසි යටතේ ඉල්ලා සිටින පරිදි, ආන්ඩුවේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල සිට ක්‍රියාත්මක වන කරුනා කන්ඩායම සහ සෙසු දෙමල පැරා-මිලිටරි කන්ඩායම් නිරායුධ කිරීමට ශ්‍රී ලංකා මිලිටරිය ක්‍රියා කල යුතු යැයි එල්ටීටීඊය දිගු කලක් තිස්සේ ඉල්ලා සිට ඇත. එල්ටීටීඊ ප්‍රකාශක දයා මෝහන් බදාදා ඩේලි මිරර් පත්‍රයට මෙසේ පැවසී යඃ " ආන්ඩුව එය (කරුනා කන්ඩායම නිරායුධ කිරීම) නොකරන්නේ නම්, අපි එය කරන්නෙමු." කඳවුරු තුන ආන්ඩුවේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල පිහිටා ඇති බවත් එය වටා හමුදා හා පොලිස් මධ්‍යස්ථාන පවතින බවත් ඔහු කියා පෑවේ ය.

ඊයේ සිදු වූ නාවික ගැටුමක් විවෘත යුද්ධය පිලිබඳ තව දුර සාක්ෂ්‍යයක් සම්පාදනය කලේ ය. මන්නාරම අසල වයඹ දිග වෙරලට ඔබ්බෙහි දී තමන් එල්ටීටීඊ යාත්‍රාවක් ගිල්වා තවත් යාත්‍රා තුනකට හානි සිදු කල බවත් එමෙන් ම ගොඩ බිම පිහිටි විශාල තුවක්කුවකට ගුවන් ප්‍රහාරයක් එල්ල කල බවත් නාවික හමුදාව නිවේදනය කලේ ය. එල්ටීටීඊ යාත්‍රා හතර නාවික හමුදා යාත්‍රාවකට පහර දීමට සූදානම් වූ බවට මිලිටරිය කියා පෑ නමුත්, මෙම ප්‍රහාරය මාර්තු මස මෙම ප්‍රදේශයේ දී ම නාවික හමුදා ප්‍රහාරක බෝට්ටුවක් ගිල්වා දැමීමට එකට එක කිරීමක් වීමට ඉඩ ඇත.

## කොලඹ යුද්ධය සඳහා උද්ඝෝෂනය

තමන් සාමය වෙනුවෙන් පෙනී සිටින බව ජනාධිපති මහින්ද රාජපක්ෂ නැවත නැවතත් ප්‍රකාශ කොට ඇත. එහෙත් පසු ගිය නොවැම්බරයේ දී ඔහුගේ තේරී පත් වීම වඩා ප්‍රහාරාත්මක ආස්ථානයක් ගැනීමට මිලිටරිය ධෛර්‍යමත් කර ඇත. ඔහු මැතිවරනය යන්තමින් ජය ගත්තේ, සිංහල අන්තවාදී පක්ෂ දෙකක් -- ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය -- සමග සන්ධානයකිනි. එල්ටීටීඊයට අවාසි වන පරිදි 2002 සටන් විරාමයේ සංශෝධනයක් අවධාරනය කිරීමටත් මිලිටරිය ශක්තිමත් කිරීමටත් සාම ක්‍රියාදාමයේ නිල පහසුකම් සලසන්නාගේ භූමිකාවෙන් නෝර්වේ ඉවත් කිරීමටත් රාජපක්ෂ ක්‍රියා කල යුතු යැයි, ඔවුන්ගේ මැතිවරන ගිවිසුම්වල කොන්දේසි මගින් ඉල්ලා සිටින ලදි.

පෙබරවාරියේ දී ජිනීවාහි දී ආන්ඩුව හා එල්ටීටීඊය අතර සාකච්ඡා -- වසර තුනකට ආසන්න කලකට පසු ප්‍රථම වතාවට පැවති සාකච්ඡා -- සිදු වූ නමුත් ආන්ඩුව සටන් විරාම ගිවිසුම සංශෝධනය කිරීමට තැත් කල විට සාකච්ඡා බිඳ වැටීමේ මුව විටට පැමිනියේ ය. පසුව නිකුත් කෙරුනු මුහුන බේරා ගැනීමේ නිවේදනයක් මගින් දෙපාර්ශ්වය ම 2002 සටන් විරාමය ආරක්ෂා කරන බවත් අප්‍රේල් මාසයේ දී තව දුර සාකච්ඡා පවත්වන බවත් ප්‍රකාශ කෙරුනි. නැගෙනහිර සිටින එල්ටීටීඊ නායකයන් වන්නි කලාපයේ පිහිටි එල්ටීටීඊයේ උතුරු මූලස්ථානය කරා ප්‍රවාහනය කිරීම අරබයා හටගත් නොවිසඳුනු මතභේදයක් මධ්‍යයේ, එම රැස්වීම දින නියමයක් නැතිව

කල් දමා තිබේ. පෙර අවස්ථාවල මෙන් නොව, මෙවර හමුදා හෙලිකොප්ටර් සැපයීම ආන්ඩුව ප්‍රතික්ෂේප කලේ ය.

ප්‍රමාදයට සැබෑ හේතුව ප්‍රවාහනය පිලිබඳ අවුල නොව උතුරේ හා නැගෙනහිර ප්‍රචන්ඩ ක්‍රියා උත්සන්න වීම සහ සාකච්ඡා සැබැවින් ම කැඳවූවත් යම් ආකාරයක සැලකිය යුතු ප්‍රතිඵලයක් අත්පත් කර ගැනීමෙහි ලා පවත්නා නොහැකියාව යි. පසු ගිය සිකුරාදා රාජපක්ෂ විසින් කැඳවන ලද සර්ව-පාක්ෂික සමුලුව මගින් පැහැදිලි කෙරුනේ, සාමය ගැන කතා කරන ගමන් ම, සමස්ත දේශපාලන සංස්ථාපිතය ම යුද්ධය සඳහා සූදානම් වීමෙහි ලා ඒකාබද්ධ වන බව යි. පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) සහ එහි සගයන් වන ජවිපෙ හා හෙල උරුමය මෙන් ම විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) ද රැස්වීමට ඇතුලත් විය.

එහි දී නිකුත් කෙරුනු ඒකාබද්ධ නිවේදනයක් මගින් ප්‍රකාශ කෙරුනේ, සියලු ම පක්ෂ "අපගේ ප්‍රජාතාන්ත්‍රික සමාජය බිය ගැන්වීමේ හා ප්‍රකෝප කිරීමේ එවන් ප්‍රයත්නයන්ට එරෙහිව සමගියෙන් හා තනි අරමුනක් සිත්හි දරා ගෙන ක්‍රියා කරන" බවත් "ත්‍රස්තවාදය පරාජය කිරීමේ හා සාකච්ඡා හරහා සාමය උදා කර ගැනීමේ" රාජපක්ෂගේ ප්‍රයත්නයන්ට සහාය දෙන බවත් ය. "ශ්‍රී ලංකාවේ භෞමික අඛන්ඩතාව සහ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීමට උදව් කරන ලෙස ජාත්‍යන්තර ප්‍රජාවට" එය ආයාචනා කලේ ය.

සාමය පිලිබඳ කල සැඳහුම් තිබිය දී ම, රැස්වීම යුද්ධය සඳහා වැඩෙන ඒකමතික භාවයක් එලිමහනට ගෙන ආවේ ය. අර්ථභාරී කරුන නම්, මීට පෙර, යුද්ධයට සාකච්ඡාමය විසඳුමක් ඉල්ලා සිටි සංගත ප්‍රභූන්ගේ ඉල්ලීම් ප්‍රකාශයට පත් කර ඇති එජාපය ද එයට එකඟ වීම ය. එජාප ප්‍රකාශක ලක්ෂ්මන් කිරිඇල්ල මැයි 2 දා ප්‍රවෘත්ති සාකච්ඡාවක දී මෙසේ පැවසී යඃ "සාම ක්‍රියාදාමය ගැටලුව විසඳීමට ඇති එක ම මාවත යි. එහෙත් ආන්ඩුවට යුද්ධය තෝරා ගැනීමට අවශ්‍ය නම්, එවිට අපි එයට පිටුබලය දෙන්නෙමු."

ආන්ඩුව යුද්ධය සඳහා සූදානම් වෙමින් මිලිටරිය ශක්තිමත් කිරීමෙහි යෙදී සිටී. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, එල්ටීටීඊ පාලනය යටතේ පවත්නා කලාපවලට යාබද ප්‍රදේශ තුල සන්නද්ධ හමුදාවන්ට සහායක හමුදාවක් ලෙස පිහිටුවනු ලබන 25,000ක ග්‍රාමාරක්ෂක බල ඇනියක අධ්‍යක්ෂක ජෙනරාල් ලෙස නාවික හමුදාවේ නියෝජ්‍ය කාර්ය මන්ඩල ප්‍රධානි සරත් වීරසේකර පත් කලේ ය. වීරසේකර, ජෙනරාල් ෆොන්සේකා මෙන් ම, එල්ටීටීඊයට එරෙහි දැඩි ආක්‍රමනශීලී පිලිවෙතක් දැරීම සම්බන්ධයෙන් කුප්‍රකට ය.

රාජපක්ෂ ආන්ඩුව පකිස්තානයෙන් මිලිටරි උපකරන මිලදී ගැනීමට අපේක්ෂා කරන බවත් "දිග ඇනවුම් ලැයිස්තුවක්" යවා ඇති බවත් බදාදා *ඉන්දියන් එක්ස්ප්‍රස්* පත්‍රය වාර්තා කලේ ය. එම පුවත් පතට අනුව, ආරක්ෂක කාර්ය මන්ඩල ප්‍රධානි අද්මිරාල් දයා සඳගිරි, මාර්තු 1 දා ශ්‍රී ලංකාවේ පකිස්තාන මහ කොමසාරිස් වෙත ලිපියක් යවමින්, "ටී-55 යුද ටැංකි සහ සී-130 හර්කියුලිස් ප්‍රවාහන ගුවන් යානා සම්බන්ධ ක්ෂනික සෝදිසියක් සඳහා කොලඹට තාක්ෂනික කන්ඩායමක්" එවන ලෙස ඉල්ලා ඇත. ශ්‍රී ලංකා මිලිටරිය අමතර කොටස් පිලිබඳ හදිසි අවශ්‍යතාවකින් පෙලෙයි.

ශ්‍රී ලංකාව යුද්ධය කරා පල්ලම් බසිමින් සිටිද්දී, මහ බලවතුන් ප්‍රචන්ඩ ක්‍රියා නතර කරන ලෙස ඉල්ලා ඇත. එහෙත් තානයේ වැටහෙන වෙනසක් පවතී. පසු ගිය සතියේ ෆොන්සේකාට එල්ල වූ ප්‍රහාරය පිලිබඳ පොදු හෙලා දැකීමක් ද එල්ටීටීඊය එරෙහිව වඩා තර්ජනාත්මක අනතුරු ඇඟවීම් ද දක්නට ලැබුනි. එක්සත් ජනපදය "දෙමල කොටින් මත අපට හැකි සියලුම ආකාර පීඩනය යොදනු පිනිස ලොව වටා සෙසු ආන්ඩු සමග සාකච්ඡා කරන" බව දකුනු ආසියානු කලාපය පිලිබඳ එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් රිචඩ් බව්චර් ප්‍රකාශ කලේ ය.

ඉන්දියානු අගමැති මන්මෝහන් සිං නේපාලය හා ශ්‍රී ලංකාව යන දෙරටේ ම අස්ථාවර තත්වය පිලිබඳව සාකච්ඡා කරනු පිනිස එරට ජාතික ආරක්ෂක කමිටුව කැඳවී ය. ඉන්දියානු වෙරල ආරක්ෂක හමුදාව සහ නාවික හමුදාව ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පෝක් සමුද්‍ර සන්ධිය තුල සිය මුර සංචාරයන් ඉහල දමා එල්ටීටීඊයේ කටයුතු නිරීක්ෂනය කිරීම පිනිස ශ්‍රී ලංකා නාවික හමුදාව සමග සහයෝගීව ක්‍රියා කරයි. ශ්‍රී ලංකාවේ විදේශ ඇමති මංගල සමරවීර ඊලඟ සතියේ නව දිල්ලියේ සංචාරයක යෙදීමට නියමිත අතර ඔහු මිලිටරි සහයෝගය තවත් වර්ධනය කරන ලෙස ඉල්ලා සිටින බව නිසැක ය.

පසු ගිය සිකුරාදා ඔස්ලෝහි රැස්වීමෙන් අනතුරුව, ජපාන විශේෂ නියෝජිත යසුෂි අකාශි, ආන්ඩුව සහ එල්ටීටීඊය සමග සාකච්ඡා පවත්වනු පිනිස අද ශ්‍රී ලංකාවට පැමිනීමට නියමිත ය. ඔස්ලෝහි දොරගුලු ලාගෙන පැවති රැස්වීම්වල දී සාකච්ඡා කෙරුනේ කුමක් ද යන වග පිලිබඳ එක් දර්ශකයක් නම්, පූර්න පරිමාන යුද්ධයක් පිපිරුන හොත් එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුමක් පිලිබඳ සලකා බැලීමට ඉඩ ඇතැයි අඟහරුවාදා ඕස්ට්‍රේලියානු ගුවන් විදුලි සේවය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී අකාශි කල ඇඟවුම යි. අකාශි ඊලඟ සතියේ දී නව දිල්ලියට ගොස් සාකච්ඡා පැවැත්වීමට ද නියමිත ය.

ජිනීවාහි තවත් සාකච්ඡා වටයක් පැවැත්වීමට ආන්ඩුව සහ එල්ටීටීඊය තල්ලු කර ගැනීමක් සිදු විය හැකි ය. එහෙත් කිසියම් සාධනීය ප්‍රතිඵලයක් ඇති වීමේ හැකියාවක් නැත. එස්එල්එම්එම් ප්‍රධානි ඔල්ෆ් හෙන්රික්සන් බදාදා *ඇසෝසියේටඩ් ප්‍රෙස්* ප්‍රවෘත්ති සේවයට කතා කරද්දී, මෙසේ පවසමින් ශුභවාදී වීමට උත්සාහ කලේ යඃ “දෙපාර්ශ්වයේ ම ක්‍රියාකාරකම් දෙස බැලූ කල, ආසන්න අනාගතයේ දී සාම සාකච්ඡා පැවැත්වීමක් ගැන මා තව දුරටත් එතරම් ශුභවාදී වන්නේ නැත. එහෙත් අපි ඒ සඳහා වැඩ කරමින් සිටිමු. එබැවින් අපි බලමු.” කෙසේ වෙතත්, ඊයේ එස්එල්එම්එම් ප්‍රකාශිකා හෙලන් ඔල්ෆ්ස්ඩොටිර් කෙලින් ම මෙසේ ප්‍රකාශ කලා යඃ “දැන් සිදු වන ප්‍රචන්ඩ ක්‍රියා උත්සන්න වීම මුලුමනින් ම පාලනයෙන් ගිලිහී ඇත. බිම් මට්ටමේ ඇත්තේ අරාජක තත්වයකි.
”

දැනටමත් ජීවිත 65,000ක් බිලි ගෙන ඇති සිවිල් යුද්ධය යලි ඇවිලීමේ අද්දර දිවයින පවතින්නේ ය යන්න සමස්ත පාලක පන්තියට ම එරෙහි අපකීර්තිමත් දෝෂාභියෝගයකි. පරිපූර්න මිලිටරි ගැටුමක් යලි ඇවිලීමෙහි ව්‍යසනකාරී සමාජ හා ආර්ථික ප්‍රතිවිපාක පිලිබඳව හොඳින් ම දන සිටියත්, ශ්‍රී ලංකාවේ ප්‍රභූව, සිය පාලනය පවත්වා ගෙන යාමේ පදනම ලෙස අඩ සියවසකට අධික කාලයක් තිස්සේ ගසා කා ඇත්තා වූ ද ප්‍රථම කොට ම යුද්ධයට පාර කපා ඇත්තා වු ද තම විෂකුරු වාර්ගික දේශපාලනය අතහැරීමෙහි ලා ඓන්ද්‍රියව අපොහොසත් ය.